**කොරියාවේ සිට ආපසු සියරට බලා පැමිණෙන විදේශගත ශ්‍රමිකයින්ට ආපසු ගෙවනු ලබන, එකවර ලබාගතහැකි ජාතික විශ්‍රාම වැටුප් මුදල් ඉල්ලුම් කිරීම**

2014 වසරේ දෙසැම්බර් මාසය වනවිට ආපසු සිය රටට ගොස් තමන්ගේ විශ්‍රාම වැටුප් මුදල එකවර ආපසු ලබාගත්, ජාතික විශ්‍රාම වැටුප් සැලසුම යටතේ ආවරණය ලැබූ මුළු විදේශික ශ්‍රමිකයින් සංඛ්‍යාව 401,096ක් වන අතර පුද්ගලයකුට ගෙවන ලද මුදල් ප්‍රමාණයේ සාමාන්‍ය අගය දකුණු කොරියානු වොන් මිලියන 2.92ක් පමණ වේ. 2014 වසරේ මුළු විදේශික විශ්‍රාම වැටුප්ලාභීන් සංඛ්‍යාව 36,414ක් වූ අතර ඉන් සාමාන්‍යයෙන් 3,000ක් පමණ වූ පුද්ගලයින් සංඛ්‍යාවක් එකවර ආපසු ගෙවීමක් වශයෙන් තම විශ්‍රාම වැටුප ලබාගෙන තිබේ. දැනට, 2015 වසරේදී මෙරට තුළ ඔවුන් පදිංචි වී සිටි කාලය අවසන් වන විදේශික විශ්‍රාමලාභීන් 404,202ක් සිටින අතර එම මුළු අගයෙන් 6,057ක්, එනම් සියයට 1.5ක් සමන්විත වන්නේ ශ්‍රී ලාංකිකයින්ගෙනි. තමන් මෙරට රැඳී සිටින්නට අපේක්ෂිත කාලය අවසන්වීමට පෙරාතුව/ අවසන්වීමෙන් අනතුරුව තමන්ගේ විශ්‍රාම වැටුප එකවර ආපසු ගෙවීමක් ලෙස ලබාගැනීම සඳහා ශ්‍රී ලාංකිකයෝ සුදුසුකම් ලබති.

එකවර සිදුකරන මෙම ආපසු ගෙවීම, විශ්‍රාම වැටුප සඳහා වන සුදුසුකම් (වසර 10ක අවම කාල පරිච්ඡේදය) සම්පූර්ණ කර නොමැත්තේ නම් එක්වරක් පමණක් සිදුකරන ගෙවීමක් වේ. එකවර ආපසු ගෙවීම සඳහා වන හේතු සාධක සම්පූර්ණ වී ඇති අවස්ථාවල (සියරටට ආපසු යාම, වයස අවුරුදු 60 සම්පූර්ණ වීම, හෝ මරණය), මූලික මුදලට පොළිය එකතු කර එම මුදල එකවර ආපසු ගෙවනු ලැබේ.

{(සියරට බලා ආපසුයාමේ හේතුව මත) එකවර සිදුකරන ආපසු ගෙවීමට සුදුසුකම් ලබන රටවල් }

| | |
|---|---|
| 13 | **සමාජ ආරක්ෂණ ගිවිසුම් හේතුවෙන් සුදුසුකම් ලබන රටවල්**<br>ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය, චෙක් ජනපදය, කැනඩාව, ප්‍රංශය, හංගේරියාව, ඔස්ට්‍රේලියාව, බෙල්ජියම, පෝලන්තය, බල්ගේරියාව, ස්ලෝවැකියාව, රොමේනියාව, ඔස්ට්‍රියාව |
| 27 | **අනුරූපතාව පිළිගැනීම හේතුවෙන් සුදුසුකම් ලබන රටවල්**<br>බෙලීසය, ග්‍රැනඩාව, ජෝර්දානය, ශාන්ත වින්සට් හා ග්‍රැනේඩීන්ස්, සිම්බාබ්වේ, කැමරූන්, තායිලන්තය, භූතානය, ඝානාව, ශ්‍රී ලංකාව, බර්මියුඩාව, මලයාසියාව, ස්විට්සර්ලන්තය, එල් සැල්වදෝරය, ඉන්දුනීසියාව, කෙන්යාව, කසකස්තානය, |